සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

විෂය - මව්බස | 2021 ජුනි 07 සිට ජුනි 13 දක්වා සතිය | සතිය - 06

ශ්‍රේණිය :- 4 | සැකසුම :- ඩබ්.කේ.ටී.මධුෂා මිය /ර/ඇඹි /තුංකම ම.වි. 4 ශ්‍රේණිය බාර

- පහත දැක්වෙන කතාව ශබ්ද නගා කියවන්න

"මේ ගෙඩි අනුභව කළ අයට වහා ම වමනය කරවන්න. ඒ අයට ඖෂධ ලබා දෙන්න." නායකතුමා අණ කළේ ය. සෙසු අය ඒ ආකාරයට කටයුතු කළ බැවින් ගෙඩි කෑ අය සුවපත් වූහ.රාත්‍රිය ගත වී පසු දිනය උදා වුණේය. උදෑසන ම ගම්වැසියෝ වහ වහා දුවගෙන ආහ. මට ගැල් ය, මට ගවයින් ය, මට වස්තුව ය, කියමින් ඔවුහු ගැල්, ගවයින් හා වස්තුව බෙදා ගැනීමට සැරසුණහ. එහෙත් දුටු දෙයින් ඔවුහු විස්මයට පත් වූහ. ගැල්කරුවන් කිසිවකු මිය ගොස් නැත. ඔවුන්ට කිසිදු උවදුරක් වූ වගක් පෙනෙන්නට ද නැත. ඔවුහු හොඳින් තම වැඩපල කරමින් ගමනට සූදානම් වෙමින් සිටියහ.

කලින් වතාවල දී වෙළඳාමේ ආ ගැල්කරුවෝ ද මෙතැන නවාතැන් ගත්හ. ඔවුහු කිම්ඵල අනුභව කොට මිය ගියහ. අනතුරු ව අසල ගම්මානයේ අය පැමිණ ඔවුන් සතු සියලු වස්තුව, ගැල් සහ ගවයින් ද රැගෙන ගියහ."මේ ගස විෂ සහිත ගසක් බව දැනගත්තේ කෙසේ ද ?"ගම්වැසියෝ ගැල්කරුවන්ගෙන් විමසූහ."මේ ගස විෂ සහිත ගසක් බව නායකතුමා දැන සිටියා. ඒ නිසා අප බේරුණා" ගැල්කරුවෝ පිළිතුරු දුන්හ. ගම්වැසියෝ නායකතුමා හමුවට ගියහ.

"ඔබතුමා මේ ගස විෂ සහිත ගසක් බව දැනගත්තේ කෙසේ ද ?" ගම්වැසියෝ නායකතුමාගෙන් විමසූහ.

නායකතුමා මෙසේ පිළිතුරු දුන්නේ ය."කාරණා කිහිපයක් නිසා මෙය විෂ සහිත ගසක් බව දැන ගතිමි. පඩිපෙළක් මෙන් අතු විහිදී ඇති ගසට කාට වුවත් පහසුවෙන් නැගිය හැකියි. එසේ ම මේ ගස ඇත්තේ ගමක් ආසන්නයේ යි. එහෙත් ගසෙහි ඉදුණු ගෙඩි පිරී ඇත. ඉදී වැටුණු, නරක් වුණු ගෙඩි ගස යට ද පිරී ඇත. ඒ ගම්වැසියන් මේ ගසේ ගෙඩි නොකන නිසා ය. ඔවුන් ඒවා නොකන්නේ විෂ සහිත නිසා බව මම සිතුවෙමි."වස්තුව බෙදා ගැනීමට ආ ගම්වැසියන්ට හිස් අතින් ආපසු යන්නට සිදු විය. නායකතුමාගේ නුවණ නිසා ගැල්කරුවෝ තම ජීවිත බේරාගත්හ. (ඵල ජාතකය ඇසුරෙණි.)

- **මෙම වාක්‍ය හරි නම් (√) යන්න ද, වැරදි නම් (×) යන්න ලකුණු කරන්න ?**

1)ගැල් නායකයා විමසිලිමත් බවින් යුක්ත ඥානවන්ත අයෙකි. ( )

2)අඹගස මිහිරි වූත් විෂ රහිත වූත් ගසක් බව ගැල් නායකයා දන ගත්තේ ය. ( )

3)ගැල් නායකයාගේ ඥානවන්ත බව නිසා ගැල් කණ්ඩායම සිදු වීමට ගිය උපද්‍රවයෙන් බේරුණි.( )

4)මියගිය පිරිසගේ වස්තුව රැගෙන යාමට පැමිණියේ අසල ගම්වැසියෝ ය. ( )

- **පහත වචන අසා ලිවීමට අවස්ථාව ලබා දෙන්න.**

ඖෂධ ,වෙළඳාම ,අනුභවය, වෘක්ෂය, භාණ්ඩ ,ප්‍රදේශය, පරීක්ෂා, විස්මයට

- ලියන ලද වචනවලින් වචන වලින් වාක්‍ය ලියන්න

1)..........................................................................................................................

2)..........................................................................................................................

3)..........................................................................................................................

4)..........................................................................................................................

5)...............................................................................................................